# පුරාවිද්‍යා උරුම සංචාරක ව්‍යාපාරය තුළ සංචාරක මග පෙන්වන්නන්ගේ භූමිකාව

**රන්දුනු විදුල සොයිසා**

Sancharakaya2012@gmail.com

ලෝකයේ සංචාරක ව්‍යාපාරය දෙස අවධානය යොමු කරන විට සංවර්ධිත මෙන් ම සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල ප්‍රධාන ආදායම් උපයන කර්මාන්තයක් ලෙස සංචාරක ව්‍යාපාරය පෙරට එමින් පවතී. එසේ ම සංචාරක ව්‍යාපාරය විවිධ විෂය ක්ෂේත්‍රයන් තුළ විහිදීයාම එහි වර්ධනයට සෘජුවම ඉවහල්වී පවතී. ඒ ආකාරයෙන් විහිදී ගිය විෂය ක්ෂේත්‍රයන් අතර පුරාවිද්‍යා උරුම සංචාරක ව්‍යාපාරය තුළ වඩාත් ජනප්‍රිය විෂය ක්ෂේත්‍රයක් ව පවතින අතර, එම කර්මාන්තය තුළ දී රටක් තුළ පවතින පුරාවිද්‍යා උරුමයන් සංචාරකයන්ගේ ආකර්ෂණය ඇතිවන අයුරින් ඔවුන් වෙත ගෙන යාමේ ප්‍රබලතම භූමිකාවන් ඉටුකරනු ලබන්නේ සංචාරක මගපෙන්වන්නා විසිනි.

ලෝක සංචාරක ව්‍යාපාරය තුළට 1995 පමණ වන විට ඇතුළත්වන පුරාවිද්‍යා උරුම සංචාරක ව්‍යාපාරය යන සංකල්පය ක්‍රියාත්මක කළ හැකි රටවල් අතුරින් ආසියාව මුලික ස්ථානයක් ගනු ලබයි. අද වන විට යුරෝපීය සංචාරකයන් බොහෝ පිරිසක් අධිරාජ්‍යවාදී යුගයන් තුල මෙන් ආසියාතික රටවල සංස්කෘතික උරුම කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වීම හරහා චීනය, ඉන්දියාව, වැනි ආසියාතික රටවල් සමූහයක් සංචාරක ව්‍යාපාරයේ ප්‍රමුඛ රටවල් 10 අතරට පැමිණ තිබේ. (Top 10) මෙම රටවල් බහුතරයක් සිය සංචාරක ව්‍යාපාරයේ ප්‍රබලතම සාධකය ලෙස භාවිතා කරනු ලබන්නේ ආසියාතික රටවල් සතු පුරාවිද්‍යා උරුමයයි. එනම් චීනය, ඉන්දියාව වැනි රටවල් වැඩිම ආදායමක් උපයනු ලබන්නේ පුරාවිද්‍යා උරුම ආශ්‍රිතව ක්‍රියාත්මක කරනු ලබන පුරාවිද්‍යා උරුම සංචාරක ව්‍යාපාරය මගිනි. එම රටවල් සතුව පුරාවිද්‍යා උරුම ස්ථාන වෙත පැමිණෙන සංචාරකයන්, දැනුවත් කිරීම සඳහා වන ක්‍රමවත් වැඩපිළිවෙලක් පවතී. එහි මූලිකත්වය ගෙන ඇත්තේ සංචාරක මගපෙන්වන්නායි. එකී රටවල් විසින් පුරාවිද්‍යා විෂයය සම්බන්ධව ප්‍රවීනත්වය ලබා ගත් පුරාවිද්‍යා උපාධිධාරීන් සහ ඔවුන් යටතේ පුහුණුව ලැබූ සංචාරක මගපෙන්වන්ගෙන් සැදුම්ලත් කණ්ඩායම් නිර්මාණය කොට තිබීම් අවධානය යොමු කළ යුතු කරුණකි.

ආසියාතික රටක් වීමත්, චීනය, ඉන්දියාව වැනි රටවලට අභ්‍යන්තරව පිහිටා තිබීමත් ශ්‍රී ලංකාව සතු පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික උරුමයෝ සමූහයක් ඉහත පසුබිමතුළ ශ්‍රී ලංකාවේ, පුරාවිද්‍යා ඌව සංචාරක ව්‍යාවහාරයක් වර්ධනයට වාසි සහගත තත්ත්වයක් උදාකර තිබේ.

ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය තුළ වර්තමානය වන විට සංචාරකයින්ගේ පැමිණීමේ වර්ධනයක් පෙන්නුම් කළද 2011 වර්ෂය තුළ සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදුකරනු ලැබූ සමීක්ෂණයකින් හෙළිවන ආකාරයට ශ්‍රී ලංකාවට එක්වරක් පැමිණි සංචාරකයෙකු නැවත මෙරටට පැමිණීමේ ප්‍රතිශතය 17% ක් තරම් අඩු අගයක් ගනු ලබයි. එයට එකම හේතුව නොවූව ද මෙරට සංචාරක මග පෙන්වන්නන්ගේ දුර්වලතා සහ හැසිරීම් රටාව සැලකිය යුතු මට්ටමකට ඉහත කරුණ සඳහා බලපාන බව අපගේ පරීක්ෂණයේ දී පැහැදිළි විය. එමෙන් ම ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයන් නැරඹීම අරමුණු කොට ගෙන පැමිණෙන සංචාරකයින් ප්‍රමාණය ද ඉතා පහළ මට්ටමක

පවතින අතර සංචාරකයන් බහුතරයකගේ අවධානය යොමුව ඇත්තේ සීගිරිය හා මහනුවර යන පුරාවිද්‍යා උරුම ස්ථානයන් කෙරෙහි පමණි. එකී ස්ථානයන්හි දී ද සංචාරක මගපෙන්වනන් විසින් සාවද්‍ය කරුණු දැක්වීම සිදුකරනු ලබන බව සංචාරකයන් ලෝකයේ ප්‍රකට සංචාරක අදහස් දක්වන වෙබ් අඩවි තුළ ඉතා අප්‍රසාදයෙන් සඳහන් කොට තිබේ. මේ අනුව පුරාවිද්‍යා උරුමයන්ගෙන් ගහණ වූ ශ්‍රී ලංකාව වැනි රටක පුරාවිද්‍යා උරුම සංචාරක ව්‍යාපාරය වර්ධනය කිරීමත් ඒ සිදහා ප්‍රබල භූමිකාවක් ඉටුකරන සංචාරක මිගපෙන්වන් පිළිබඳව සොයා බැලීමත් අත්‍යවශ්‍ය කරුණක් වේ. මේ අනුව ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා සංචාරක ව්‍යාපාරය අභිවෘද්ධියකට දායකවන ප්‍රධාන ස්ථානයක් ලෙස සංචාරක මගපෙන්නන් අප විසින් හඳුනාගැනීමෙන් අනතුරුව දැනට ශ්‍රී ලංකාවේ පවතින සංචාරක මග පෙන්වන්නන් වර්ගීකරණයත්, එහිදී මගහැරී තිබෙන පුරාවිද්‍යා මග පෙන්වන්නා පිළිබඳවත්, අතීතයේ මෙරට දේශීය මග පෙන්වන්නෙක්ව සිටි නඩේ ගුරාගේ චරිතය පිළිබඳවත් අධ්‍යයනය කරන ලදී. එසේ ම යටත් විජිතයක් ලෙස මෙරට පැවතුන සමයන් හිදී මෙරට සංචාරක මිග පෙන්වන්නන්ගේ හැසිරීම හා වත්මන් සංචාරක මගපෙන්වන්නන්ගේ භූමිකාව ද විමර්ශනයට ලක් කර ලදී. එහි දී වත්මන් පුරාවිද්‍යා සංචාරක මගපෙන්වන්ගේ භෞතික පසුබිම, දුර්වලතා, ශක්‍යතා හඳුනාගැනීමත් ඔහුගේ ස්වභාවයත් සමාජය තුළ ඔහුට යම් ස්ථානයත් පිළිබඳව අධ්‍යයනය කරන ලද අතර අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා සංචාරක මගපෙන්වන්නන් යනු කවරෙක් ද? ඔහුගේ භූමිකාව සාර්ථක ද? අසාර්ථකද? යන්න අධ්‍යයනය කරන ලදී.

මේ සඳහා සංචාරක මණ්ඩලය, මධ්‍යම සංස්කෘතික අරමුදල ආශ්‍රිත වාර්ෂික වාර්තා විදේශික සංචාරකයන්ගේ වාර්තා මූලාශ්‍ර ලෙස යොදාගත් අතර සංචාරකයන් හා සංචාරක මගපෙන්වන්නන් සම්බන්ධ කරගත් සහභාගීත්ව පරීක්ෂණ, සංචාරකයන් සඳහා පහසුකම් සපයන ආයතන හා ඒ ආශ්‍රිත නිළධාරීන් සම්බන්ධ කොටගත් සම්මුඛ සාකච්ඡා ආශ්‍රිතව දත්ත විශ්ලේෂණයක් සිදුකරන ලදී. මෙම පර්යේෂණය තුළ දී ශ්‍රී ලංකාවේ සංචාරක මග පෙන්වන්නන් වර්ග කිරීමේ විශාල අඩුපාඩුවක් පවතින බව හඳුනාගත් අතර පුරාවිද්‍යා උරුමයන් බහුතරයක් පවතින රටක් වුවද, මෙරට පුරාවිද්‍යා ස්ථානය ආශ්‍රිතව විශේෂඥ දැනුමක් පවතින සංචාරකයන් දැනුවත් කිරීම සඳහා වූ සංචාරක මගපෙන්වන්නන් නොමැති බවද හඳුනා ගන්නා ලදී. එසේ ම දැනට එම ස්ථාන ආශ්‍රිතව සංචාරක මගපෙන්වන්නන් විසින් සිදුකරන සාවද්‍ය සහ සංචාරකයන් නොමග යන සුළු කරුණු දැක්වීම් තුළින් විදේශීය සංචාරකයන් බොහෝමයක් මෙරට පුරාවිද්‍යා ස්ථාන ආශ්‍රිතව සංචාරක මිග පෙන්වනන් ප්‍රතික්ෂේප කරන මට්ටමට පත්වී ඇති බව ඇති බව ද හඳුනා ගන්නා ලදී. ඒ අනුව මෙරට පුරාවිද්‍යා උරුම සංචාරක මගපෙන්නන්ගේ භූමිකාව අසාර්ථක තත්ත්වයට පවතින බව පැහැදිළි විය.

වත්මන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන කර්මාන්තයක් බවට පත්ව ඇති සංචාරක ව්‍යාපාරය තවදුරටත් වර්ධනය සඳහා පුරාවිද්‍යා සංචාරක ව්‍යාපාරය (Archaeological Heritage Tourism) මෙරටට හඳුන්වා දී එය නව කර්මාන්තයක් ලෙස ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කළ යුතුය. මෙමගින් බහු විෂයාත්මක අධ්‍යයනයක් වන පුරාවිද්‍යා විෂයේ තවත් එක් විෂය ක්ෂේත්‍රයකට වැදගත්කමක් ද පුරාවිද්‍යා විෂය නවමාවතකට විවර වීමක් ද සිදු වේ. එලෙස ම පුරාවිද්‍යා උරුම සංචාරක ව්‍යාපාර හා එහි වැදගත්කම, ව්‍යාපෘතිය, අඩුපාඩු හා එයට එක්විය යුතු අංග අධ්‍යයනය කොට ඌණනය කිරීමට අවස්ථාවක් සැලසේ.

ශ්‍රී ලංකාව විශේෂීකරණයකින් යුක්ත සංචාරක මගපෙන්වන්නන් පුරාවිද්‍යා උරුම සංචාරක ව්‍යාපාරයට යොමු කිරීමත් පුරාවිද්‍යා විෂය යටතේ සංචාරක මගපෙන්වන්නා පුහුණු කළ යුතු ආකාරය හඳුනාගැනීම මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කටයුතු වර්ධනය සඳහා පුරාවිද්‍යා විෂයෙන් හා ඒ ආශ්‍රිත සම්පත්දායකයන්ගෙන් කවර ආකාරයේ දායකත්වයක් ලබාගත යුතු ද යන්න හඳුනාගැනීමත් මෙම පත්‍රිකාව ඉදිරිපත් කිරීම හරහා අප විසින් අරමුණු කරගන්නා ලදී.

මූඛ්‍ය පද :-   සංචාරක මග පෙන්නන්, සංචාරක ව්‍යාපාරය, පුරාවිද්‍යා උරුමය